PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

ප්‍රවෘත්ති කර්තෘ/ සංස්කාරක, 2014.12.23

## ජනාධිපතිවරණය 2015

## තැපැල් ඡන්ද විමසීම - සමස්තයක් ලෙස සාමකාමීයි.

මෙවර ජනාධිපතිවරණයට අදාළව තැපැල් ඡන්ද විමසීම 2014.12.23 සහ 24 යන අද සහ හෙට දිනයන් තුළ සිදු කිරීමට මැතිවරණ කොමසාරිස් වරයා විසින් කටයුතු යොදා ඇත.

ජනාධිපතිවරණයේ තැපැල් ඡන්ද භාවිත කිරීම සඳහා අයදුම්පත් 626,715 ක් ලැබී තිබූ අතර, ඉන් 84,884 ක් ප්‍රතික්ෂේප වී ඇත. ඒ අනුව තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ලැබූ පිරිස 541,831 කි. සියළුම දිස්ත්‍රික්ක අතුරින් වැඩිම තැපැල් ඡන්ද ප්‍රමාණයක් මෙවර ද කුරුණෑගල දිස්ත්‍රික්කයට හිමිවී ඇති අතර, එය 66,934 ක ප්‍රමාණයකි.

1. තැපැල් ඡන්දය අද දිනය තුළ සමස්තයක් ලෙස සාමකාමීව පැවැති අතර එක් ගැටුමක් පමණක් ත්‍රිකුණාමලය ගෝමරන්කඩවල ප්‍රදේශයෙන් වාර්තා විය. එහිදී එක්සත් ජනතා නිදහස් සංධානයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී (සඳුන් හේමන්ත) මහතා තුවාල ලැබීය. එමෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයේ ලබුදූව දක්ෂිණපායෙදී, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ඇතුලු පිරිසක් අත්පත්‍රිකා බෙදීමට යාමේදී බහින්බස් වීමක් පිළිබඳව ද වාර්තා විය. ප්‍රවීන දේශපාලඥයෙකු වූ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා එවැනි කටයුත්තකට දායකවීම කණගාටුවට කරුණකි. එමෙන්ම එහිදී මැතිවරණ නිලධාරීන්ගේ සහ පොලිස් නිලධාරීන්ගේ කටයුතුවලට ද බාධා කිරීම් සිදුවූ බවට වාර්තා වේ. කෙසේ වෙතත් ඊට අදාළ වාහනය මේ වන විට මැතිවරණ නිලධාරීන්ගේ භාරයට ගෙන ඇත.

2. අද දිනය තුළ අම්පාර දිස්ත්‍රික්කයේ අනියම් හා අදේශක කම්කරුවන්ට ස්ථිර පත්වීම් ලබාදීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඩී.එම්.ආරියරත්න ශාලාවේ පැවැති රැස්වීමක් සහකාර මැතිවරණ කොමසාරිස් වරයාගේ මැදිහත්වීම හරහා වළක්වා ගැනීමට හැකිවිය.

3. මෙවර තැපැල් ඡන්ද භාවිතයේදී ගමනාගමන මණ්ඩලයේ සහ සිවිල් ආරක්ෂක කඳවුරු සහ හමුදා කඳවුරුවල අක්‍රමිකතා විය හැකි යයි දිගින් දිගටම පැමිණිලි ලැබුණු අතර ඒවා සැළකිල්ලටගෙන මැතිවරණ කොමසාරිස් වරයා විසින් ඡන්ද 35 ට වැඩි සෑම ස්ථානයකටම විශේෂ නියෝජිතයෙක් ද ඡන්ද 75ට වැඩි සෑම ස්ථානයකටම මාණ්ඩලික නිලධාරියෙක් ද යෙදවීමට ගත් ක්‍රියාමාර්ග අතිශයින් අගය කළ යුතුය. එමගින් බොහෝ සැකසංකා ඉවත් කිරීමට ද හැකිවිය.

4. ඡන්ද පත්‍රිකා බෙදාහැරීම හා ඡන්දය ආයාචනා කිරීම කටවුට් බැනර් ප්‍රදර්ශනය වැනි සිදුවීමක් ප්‍රදේශ කිහිපයකින්ම වාර්තා විය. ඡන්ද පොළ නියෝජිතයින් නියමිත වේලාවට තැපැල් ඡන්ද මධ්‍යස්ථාන වෙත වාර්තා නොකිරීම ද කැපී පෙණුන ලක්ෂණයකි.

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel : (+94) 11 2514441 / 11 2514442   Fax : (+94) 11 2514443

සමස්ථයක් ලෙස අද දින පැවැති තැපැල් ඡන්දය සාමකාමීව පැවැති අතර ඡන්දය භාවිත වීමද ප්‍රශස්ථ මට්ටමක තිබූ බව පැෆ්රල් සංවිධානයේ නිරීක්ෂණය විය.

පැෆ්රල් සංවිධානය තෝරාගත් ඡන්ද මධ්‍යස්ථාන සඳහා නිරීක්ෂකයින් 1000 ක් ද ජංගම නිරීක්ෂණ රථ 35ක් ද යොදවන ලදී. විශේෂයෙන් උතුරු පළාතට අදාළව ජාතික මට්ටමේ කණ්ඩායමක් ද යොදවන ලදී.

ස්තුතියි.

මෙයට විශ්වාසි,

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ.